# ආර්ථිකය ගොඩ ගැනීමට අවම පොදු වැඩපිළිවෙලක්

සාධාරණ සමාජයක් සඳහාවූ ජාතික ව්‍යාපාරය

2022 ජූනි 15

අප මුහුණදී සිටින්නේ මින්පෙර මුහුණ නොදුන් ආකාරයේ අර්බුදයකටය. මෙය 2001-02 සමයේ සෘණාත්මක ආර්ථික වර්ධනය සමග සමාන කළ නොහැකිය. එය අනුරූප වන්නේ අවුරුදු 90කට පෙර මහා අවපාතයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය වසර කීපයක් ඇතුළත ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 80 සිට 33 දක්වා කඩාවැටුණු අවස්ථාවටය.

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ඉහළම ආදායම් විෂමතාව සහිත රටයි (ජාත්‍යන්තර සන්සන්දනයන් ගත් කල චීනයේ සහ ඇමරිකා එක්සත් ජනපදය අතර). අධි වසංගතය ආශ්‍රිත ලොක්ඩවුන් හේතුවෙන් ඇතිවූ තත්වය වෙනුවෙන් ආණ්ඩුව පහළ ආදායම් මට්ටම්වල පුරවැසියන් හට සහන ලබාදුන්නේ මද ප්‍රමාණයෙනි. ඔවුන්ට මෙම අමතර පීඩනයන් දරාගත නොහැක. වේදනාකාරී පියවරවලින් තොරව මෙම අර්බුදයෙන් ගොඩඒමට හැකියාවක් නැත. එහෙත්, මනාව සැලසුම් කරන ලද ආර්ථිකය යථා තත්වයට පත්කිරීමේ වැඩසටහනක් ඔස්සේ, විශේෂයෙන්ම දැඩිම අවදානමට ලක්වන ජනතාවගේ වේදනාව අවම කළ හැකිය.

අතීතයේදී කළා මෙන්, හැකි පළමු අවස්ථාවේදීම අප විසින් රාජ්‍ය මූල්‍ය විනය අත්නොහළ යුතුය. මෙම ප්‍රතිසංස්කරණ වෙනුවෙන් අප දැඩි ලෙස කැප විය යුතුය. හේතුව ඒවා අපගේ තීරණ වීම සහ මෙවැනි අර්බුද නැවත ඇතිවීම වැළැක්වීමට තිබෙන එකම ක්‍රමය ඒවා වීමයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යරාමුව තුළ වැඩකිරීමට දේශපාලනඥයන් අකැමැති විය හැකිය. එයට හේතුව වන්නේ දුෂ්කර මෙන්ම අත්‍යවශ්‍ය ද වන ආර්ථික ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වගකීම ගැනීමට ඔවුන් බිය වීමයි. සහභාගි වන සියලු පාර්ශ්වවලට අරුත්බර වගකීමක් පැවරෙන අවම පොදු වැඩපිළිවෙලක් සකස් කරගත යුතුව තිබෙන්නේ ඒ නිසාය. එය මුදල් පාලනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාමය වගකීම යටතේ කළ යුතුය.

මාස 10ක කාලයක් තුල අප විසින් සකස්කරන ලද පොදු අවම වැඩපිළිවෙලක් පහත ඉදිරිපත් කරනු ලැබේ. එම වැඩපිළිවෙල සැකසීම සඳහා බොහෝ පුද්ගයන්ගේ සහ සංවිධානවල අදහස් සහ විශේෂඥභාවය ලබාගන්නා ලදි. පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හී වහා ක්‍රියාත්මක කළ හැකි යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

1. සාර්ව ආර්ථික ස්ථාවරභාවය (p. 2)
2. ආදායම් ස්ථාවර කරගැනීම (p. 3)
3. ප්‍රාථමික වියදම් පාලනය (p. 4)
4. රාජ්‍ය අංශය සහ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය (p. 5)
5. සමාජ ආරක්ෂණ ජාලය (p. 7)
6. බලශක්තිය සහ මහජන උපයෝගිතා (p. 7)
7. වෙළඳාම සහ කර්මාන්ත (p. 8)
8. යලි ගොඩනැගීම සඳහා විශේෂිත නීති (p. 9)

## ලේඛනය සකසා ගත් ආකාරය

අර්බුදයෙන් ගොඩඒම හා නැවත සිදුවීම වැළැක්වීම සඳහා ක්‍රියාකිරීම පිණිස ජාතික සම්මුතියක් නිර්මාණය කරගැනීම අවශ්‍යවන බව 2021 මැද භාගය වන විටදී සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය විසින් අවබෝධ කරගන්නා ලදි. ප්‍රතිපත්තිමය ආස්ථාන සංවර්ධනය කිරීමේ විශේෂඥභාවය ලබාගැනීමේ භාවිතාවක් ලෙස ‘කතිකාව’ වෙබ් සම්මන්ත්‍රණ මාලාව 2021 ජුලි මස සිට සංවිධානය කරන ලදී. ඉන් අනතුරුව, පොදු අවම වැඩසටහනක් පිළිබඳ කෙටුම්පතක් 2022 පෙබරවාරි මාසයේදී භාෂා තුනෙන්ම සම්පාදනය කර වැඩිදුර සාකච්ඡාව සඳහා මාධ්‍ය සහ වෙනත් මාර්ග ඔස්සේ ඉදිරිපත් කරන ලදි.

මෙම වකවානුවේදීම, දේශපාලන පක්ෂ, සංවිධාන සහ බුද්ධි මණ්ඩප ඇතුළු විවිධ සංවිධාන විසින් අර්බුදයෙන් ගොඩ ඒමට නිර්දේශ ඉදිරිපත් කරන ලදි. පසුගිය මාස කීපය තුළදී බොහෝ ලේඛන පළවූ අතර ඒ සම්බන්ධයෙන් පරිපූර්ණ ආවරණයක් ලබාගැනීම දුෂ්කර විය. කෙටි කාල රාමුවක් තුළ ක්‍රියාත්මක කළ හැකි ආර්ථික නිර්දේශ දෘෂ්ටිවාදීමය වශයෙන් පුළුල් ලේඛන පද්ධතියකින් තෝරාගෙන විශ්ලේෂණය කරන ලදි (1 ඇමුණුම). රාජ්‍ය වියදම් පාලනය කිරීම සහ කාර්යක්ෂම සහ මනා ලෙස ඉලක්ක කරන ලද ආරක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීම වැනි අවශ්‍යතා වෙනුවෙන් කැපීපෙනෙන එකඟතාවක් දක්නට ලැබිණි. වෙළඳ සහ රාජ්‍ය දේපළ වැනි කාරණා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අදහස් අතර යම් පරස්පරතා තිබිණි.

යෝජනාවලියන්ගේ සංසන්දනාත්මක විශ්ලේෂණයේ ප්‍රතිඵල ආර්ථික විද්‍යාඥයන් කණ්ඩායමකට ඉදිරිපත් කරන ලදි (2 ඇමුණුම). ඔවුන් විසින් එහි අන්තර්ගතය හා ප්‍රමුඛතා සම්බන්ධයෙන් වෙනස්කම් යෝජනා කරන ලදි. සංශෝධිත නිර්දේශ සඳහා වලංගුතාව ලබාගැනීම සඳහා ව්‍යාපාරික නයකයන්ගේ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන ලදි (3 ඇමුණුම). එහිදීද ලියවිල්ලෙහි වෙනස්කම් සිදුකරන ලදි. අවසන් ලේඛනය මූලික ලේඛනයෙන් කැපීපෙනෙන අන්දමින් වෙනස් එකකි.

## යෝජනා

ශීර්ෂ අටක් යටතේ යෝජනා ගොනු කරන ලදි. එම ශීර්ෂ නිර්ණය කරන ලද්දේ විශ්ලේෂණය සහ වලංගු කරවාගැනීම අතරතුරදීය. එක් එක් විශේෂිත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කාලරාමු පිළිබඳ ආර්ථික විද්‍යාඥයන්ගෙන් විමසන ලදි. කෙටිකාලීන ක්‍රියාමාර්ග 2022 වසර තුළදී ද, මධ්‍යම කාලීන ක්‍රියාමාර්ග 2023 වසර අවසානය වන විට ද, දිගුකාලීන ක්‍රියාමාර්ග 2023 අවසානය වන විට ද සම්පූර්ණ කළ යුතු බවට කාලරාමු ඉදිරිපත් කරනු ලබන්නේ සාකච්ඡාවට ආරම්භක ස්ථානයක් ලෙස පමණි.

### 1. සාර්ව ආර්ථික ස්ථාවරභාවය

ආර්ථික නායකත්ව කණ්ඩායම පත් කර තිබේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා උපදේශකවරුන් තෝරාගෙන ඇත. ජාත්‍යන්තර  සාකච්ඡාව ඉදිරියට යන අතරතුර ඉදිරිපත් කරන ලද පහත දැක්වෙන යෝජනා මගින් දැනට මැනැවින් සිදුවේ යයි සිතිය හැකි කටයුතු දෙස වඩා ගැඹුරින් විමසා බලනු ලැබේ. මේ සම්බන්ධ බොහෝ පදනම් ලේඛන සකස් කරනු ලැබුවේ ඉහත දක්වන ලද ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට පෙරයි. මෙම ලේඛනය සම්පාදනයේ අවසන් අදියරේදී ක්‍රියාත්මක කරන ලද නිර්දේශ මෙයට ඇතුළත් කර නැත.

දැනට කෙටුම්පත් මට්ටමේ තිබෙන මූල්‍ය නීති පනතට ප්‍රමුඛතාව ලබාදිය යුතු බව නිර්දේශ කරන ලදි. එමගින් ශ්‍රී ලංකා මහබැංකුවේ ස්වාධීනතාව තහවුරු කරනු ලැබේ. සාර්ව ආර්ථික ස්ථාවරභාවය නිර්මාණය කිරීම සඳහා එය අත්‍යවශ්‍යය. රාජ්‍ය ණය පිළිබඳ දත්ත හැමවිටම නිවැරදි බව තහවුරු කළ යුතු බව සම්බන්ධයෙන් අවධානය යොමුකරනු ලැබේ. විවිධ ස්වරූපයේ ණය සහ ඇපකරයන් කළමනාකරණය සම්බන්ධයෙන් වෘත්තිකමය එළඹුමක් අනුගමනය කළ යුතුය. යෝජිත රාජ්‍ය ණය කාර්යාලය ඉහළ පෙළේ සුදුසුකම් සහිත පළපුරුදු වෘත්තිකයන් විසින් තනතුරු දැරිය යුතු ප්‍රභූ ආයතනයකි. එම කාර්යාලය මහබැංකුව තුළ ස්ථාපිත නොකළහොත් එවැනි වෘත්තිකයන් සඳහා ප්‍රමානවත් දීමනා ක්‍රමයක් සැකසීම අභියෝගයක් වනු ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ණය කාර්යාලය මහබැංකුව තුළ ස්ථාපිත කිරීම මගින් මහබැංකුවේ මූලික අරමුණුවලට බාධා සිදුවේද යන කරුණ කෙරෙහි අවධානය යොමුවිය.

| මැදිහත්වීම | කාල සීමාව |
|---|---|
| මේ වන විට තිබෙන සියලු ණය සහ ඇපකරයන් ගැන විගණනයක් පැවැත්වීම | කෙටිකාලීන |
| බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම වසර අවසානයට පෙර සිදුකිරීම | කෙටිකාලීන |
| ස්වාධීන මහබැංකුවක් පිහිටුවීම, මුදල් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් විනයක් නිර්මාණය කිරීම සඳහා මූල්‍ය නීති පනත සම්මත කරගැනීම, ශ්‍රී ලංකා මහබැංකුවේ ආයතනික | කෙටිකාලීන |

| | |
|---|---|
| ස්වාධීනත්වය ගොඩනැගීම සහ උද්ධමනය ඉලක්ක කිරීම සඳහා නීතිමය රාමුවක් නිර්මාණය කිරීම | |
| ශ්‍රී ලංකා මහබැංකුවේ දේශීය ශේෂ පත්‍රය පරිස්සමෙන් හා ක්‍රමානුකූල අන්දමින් ඉක්මණින් හැකිළීම. ඒ හා සමාන්තරව වෙළඳපොළ පොළී අනුපාතික සහ විදේශ ආදායම් ඉහළ නැංවීම | මධ්‍යකාලීන |
| අවශ්‍ය ඉහළ කුසලතා සහිත (නියමිත ගෙවීම් කරන ලද) වෘත්තිකයන්ගෙන් සමන්විත මධ්‍යම රාජ්‍ය ණය කාර්යාලයක් පිහිටුවීම. එම කාර්යාලය මහබැංකුව තුළ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන්සලකාබැලිය යුතුය. ඒ වෙනුවෙන් නීති සම්පාදනය කිරීම අවශ්‍ය වනු ඇත. | මධ්‍යකාලීන |
| දේශීය ප්‍රභවයන් ලබාගන්නා ලද ණය ප්‍රතිව්‍යුහගත නොකළ යුතුය. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් අවශ්‍ය නම් එම ප්‍රතිව්‍යුහගත කිරීම කිසියම් විධිමත් නියාමනයකට ලක්කළ යුතුය (එය රාජ්‍ය ණය කාර්යාලයේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතුය). ඒවා බැඳුම්කර බවට පත්කිරීම හා මධ්‍යම කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම සලකා බැලිය යුතුය. | මධ්‍යකාලීන |

## 2. ආදායම් ස්ථාවර කිරීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වැඩසටහනකට ඇතුළත් වීම සඳහා කාලය තුළ ඉටුකිරීම සඳහා බැඳුණු අරමුණු කෙරෙහි දක්වන කැපවීම වැදගත් වේ. ඒ සඳහා වර්තමාන මට්ටමේ සිට ඉහළට ආදායම් මට්ටම ඔසවා තැබිය යුතුය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අදාළ කර නොගත්ත ද මෙය ප්‍රශංසනීය අරමුණකි. 2019 දෙසැම්බරයට පෙර පැවති බදු ප්‍රතිපත්තිය නැවත සැකසීමට ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා දැනටමත් මුලපුරා තිබේ. එබැවින් පහත දැක්වෙන යෝජනාව මගින් 2019 ආදායම් ක්‍රියාමාර්ග ප්‍රතිස්ථාපනය කිරීම ඉක්මවා කාර්යයන් වෙත අවධානය යොමුකරනු ලැබේ.

සේවා වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු සහ රාජ්‍ය දේපළවල ආදායම වැඩිකරගැනීමෙන් බදු නොවන ආදායම් වර්ධනය කරගැනීම අවශ්‍යය. කෙසේ වෙතත්, ඒ අතරතුරම, ආදායම් එකතු කිරීමේ වියදම් අඩුකිරීම කෙරෙහි ද අවධානය යොමුකළ යුතු අතර සපයනු ලබන සේවාවන් වැඩිදියුණු කළ යුතුය. උදාහරණයක් ලෙස, ලේඛන කටයුතු අවම කළ හැකිය. ගාස්තු එකතු කරන අවස්ථා ගණන අඩුකළ හැකිය. සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කර ගාස්තු වැඩි කළ විට එයට එල්ලවන විරෝධය අඩුය. ඇතැම් අවස්ථාවලදී එකතුකරනු ලබන ගාස්තු බැරවන්නේ වගකීම් විරහිත ආයතනවල ගිනුම්වලටය. අවශ්‍ය ප්‍රමාණයට වඩා මුදල් තිබෙන ඕනෑම අරමුදලක වැඩි මුදල් වහා ඒකාබද්ධ අරමුදලට බැරකිරීම වැදගත්ය.

ආයෝජකයන්ට බදු සහන ලබාදීම සම්බන්ධ භාවිතාවන්ගේ බොහෝ සෘණාත්මක කාරණා තිබේ. 2008 අංක 14 දරණ මුලෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ කරනු ලබන බදු අහෝසි කිරීම් අත්හිටුවිය යුතුය. ඒ යටතේ වර්තමානයේ ප්‍රතිලාභ ලබන අය ද අවම විකල්ප බදු ක්‍රමයකට යටත් කළ යුතුය. එය 15%ක් විය යුතු යයි යෝජනා කර තිබේ. ශ්‍රී ලංකාව පදනම් ඛාදන දහ ලාභ රැගෙනය යාම (Base Erosion and Profit Shifting - BEPS) සම්බන්ධ ව්‍යුහයකට ඇතුළත් විය යුතුය. ප්‍රගතිශීලී සමාගම් බදු ක්‍රමයක් නිර්මාණය කළ යුතු අතර එහි තියුණු කප්පාදු කිරීම් නොතිබිය යුතු බව නිර්දේශ කරනු ලැබේ.

රේගු නිලධාරීන්ගේ ප්‍රදාන යෝජනා ක්‍රමය ඇතුළු රේගු සංශෝධන නිර්දේශ කරනු ලැබේ. සංකීර්ණ බදු ව්‍යුහයන් වෙනුවට තල තුනක බදු ව්‍යුහයක් ස්ථාපිත කර අතුරු බදු ක්‍රමානුකූලව අහෝසි කළ යුතුය.

ශ්‍රී ලංකාවේ ආදායම් පරිපාලනයේ දක්නට ලැබෙන කැපීපෙනෙන දුර්වලකම් සම්බන්ධයෙන් විසඳුම් ලබාදිය යුතුය. අභියෝගාත්මක කාර්යයක් වුව ද, ඒකාබද්ධ ආදායම් පරිපාලනයක් නිර්මාණය කළ යුතුය. එමගින් දේශීය ආදායම්, රේගු හා සුරාබදු අංශ ඒකාබද්ධ කිරීම වහා කළ යුතුය.

| මැදිහත්වීම | කාල සීමාව |
|---|---|

| | |
|---|---|
| රඳවා තබාගැනීමේ බද්ද නැවත හඳුන්වාදී පුළුල් කළ යුතුය (එයට ප්‍රාග්ධන හා සේවා ගෙවීම් ද ඇතුළත් කළ යුතුය). | කෙටිකාලීන |
| රාජ්‍ය දේපළ තක්සේරු කිරීම සඳහා කාර්යසාධන බලකායක් නිර්මාණය කළ යුතුය. බදු නොවන ආදායම් වර්ධනය කිරීම සඳහා අවස්ථා හඳුනාගත යුතුය. රජයට අයත් දේපළ, ගාස්තු සහ රාජ්‍ය ආයතනවල ආදායම් ්ඔස්සේ ආදායම වර්ධනය කරගත යුතුය. ඒ හා සමාන්තරව සේවා ගුණාත්මකභාවය වර්ධනය කිරීමට ද වගබලාගත යුතුය. ආයතනවලින් ලබාගත හැකි නිශ්චිත අරමුදල් තිබෙන අවස්ථාවලදී ඒවා ඒකාබද්ධ අරමුදල වෙත බැරවන බවට වගබලාගත යුතුය. | කෙටිකාලීන |
| දිගුකාලීන, ස්ථාවර බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කළ යුතුය. ඍජු විදේශ ආයෝජන වෙනුවෙන් බදු කප්පාදු සම්බන්ධ දිරිගැන්වීම් නොකළ යුතුය. | මධ්‍යම කාලීන |
| ප්‍රගතිශීලී සමාගම් බදු ක්‍රමයක් සම්පාදනය කළ යුතුය. එහි අනුපාතිකය වැඩි කිරීම ක්‍රමානුකූල විය යුතුය. | මධ්‍යම කාලීන |
| ආදායම් බදු පදනම පුළුල් කළ යුතුය. බදු ගෙවන්නන්ගේ ලිපිගොනු සංඛ්‍යාව අඩුවීම වෙනස් කර වැඩිකරගත යුතුය. | මධ්‍යම කාලීන |
| බදු එකතුකිරීමේ යාන්ත්‍රණයන් වැඩිදියුණු කළ යුතුය. | මධ්‍යම කාලීන |
| BEPS ඩිජිටල් ආර්ථික ව්‍යුහයෙහි හවුල්කරුවකු බවට පත්විය යුතුය. බහුජාතික සමාගම් වෙනුවෙන් (දෙවන කුලුන යටතේ) 15%ක අවම විකල්ප බද්දක් පැණවිය යුතුය. අලුත් ආයෝජනවලට SDP තත්වය ලබාදීම නැවැත්විය යුතුය. ඔවුන් ද 15%ක විකල්ප අවම බද්දක් ගෙවිය යුතුය. | මධ්‍යම කාලීන |
| වැඩිදියුණු කරන ලද අවදානම් පාදක විමර්ශන වැනි රේගු සංශෝධන හඳුන්වාදිය යුතුය. රේගු නිලධාරීන්ගේ ප්‍රදාන ක්‍රමය සංශෝධනය කළ යුතුය. දණ්ඩනයන් විධිමත් කළ යුතුය. එමගින් අත්තනෝමතික දිරිගැන්වීම් ක්‍රමය වෙනස් කළ යුතුය. | මධ්‍යම කාලීන |
| තල තුනක් යටතේ බදු විධිමත් කළ යුතුය. අතුරු බදු ඉවත් කළ යුතුය (ඒවා වෙනුවට VAT පැණවිය යුතුය). | මධ්‍යම කාලීන |
| ඒකීය ආදායම් පරිපාලනයක් ස්ථාපිත කළ යුතුය. එහි ආයතන තුනක් අඩංගු වේ (එනම්, රේගු, දේශීය ආදායම් සහ සුරාබදු දෙපාර්තමේන්තුය). | දිගුකාලීන |

## 3. ප්‍රාථමික වියදම් පාලනය

2002 අංක 3 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධාන විධිමත් ලෙස අනුගමනය කළ යුතු බව අවධාරණය කරනු ලැබේ. එය බලාත්මක කිරීමේ සිට පවතින බලාපොරොත්තු සුන්කරනසුලු අතීත ක්‍රියාකාරීත්වය හේතුවෙන්, අනුගත වීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමට සාපේක්ෂව එම පනත ශක්තිමත් කිරීමේ සාපේක්ෂ වැදගත්කම සම්බන්ධයෙන් අදහස් අතර බෙදීමක් තිබිණි. අවසානයේදී, අලුතෙන් පුබුදුවී සිටින පුරවැසියන්ගේ සහභාගී අධීක්ෂණය ඔස්සේ අනුගත වීම සම්බන්ධයෙන් වගබලාගත හැකිය යන පදනමින් සංශෝධනවලට සහාය ලැබිණි.

විශාල ණය මගින් අරමුදල් සම්පාදනය කරගෙන කරනු ලබන ව්‍යාපෘතිවලට අවසර ලබාදීමේදී එම ජාතික භෞතික සැලැස්මට අනුකූල ද යන කරුණ සහ සියලු නිර්ණායක සපිරේද යන්න සලකා බැලිය යුතු බවට ඉදිරිපත් වූ යෝජනාවෙන් එවැනි ව්‍යාපෘතිවල ශක්‍යතාවේ අඩුකම පිළිබඳ ගැටලුව නිරූපණය විය. ජාතික භෞතික සැලැස්ම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනය යෝග්‍ය අමාත්‍යාංශයකට අයත් විය යුතු අතර එයට ව්‍යාපෘතිවල අනුගතභාවය තහවුරු කිරීමේ බලය සහ අරමුදල් තිබිය යුතුය.

| මැදිහත්වීම | කාල සීමාව |
|---|---|
| දැනට පවත්නා රාජ්‍ය මූල්‍ය ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ශක්තිමත් කරන්න. ව්‍යතිරේක පැහැදිලිව අර්ථ නිරූපණය කරන්න. වගවීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදෙන්න (දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබිය හැකිය). | කෙටිකාලීන |
| ජාතික භෞතික සැලැස්මට අනුකූල නොවන, නිසි ශක්‍යතා අධ්‍යයනයකින්, මූල්‍ය විශ්ලේෂණයකින්, පාරිසරික ඇගයීමකින් හෝ සමාජ විග්‍රහයකින් තොරව කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති නතර කරන්න. | කෙටිකාලීන |
| පොදු අයවැයෙන් මාර්ග සංවර්ධනය වැනි දිගුකාලීන ව්‍යාපෘති සඳහා ලබාදෙන ප්‍රාග්ධන වියදම්වල හැකි සෑම විටදීම වඩා වැදගත් ප්‍රමුඛතා වලට යොමු කරන්න. | කෙටිකාලීන |

## 4. රාජ්‍ය අංශය සහ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය

රාජ්‍ය අංශයේ අලුත් බඳවාගැනීම් අත්හිටුවන ලෙස දැඩිව නිර්දේශ කරනු ලැබේ. සියලු පුරප්පාඩු පිරවිය යුතු වන්නේ දැනටමත් රාජ්‍ය සේවයේ සිටින අයගෙනි. ආරක්ෂක වියදම් යුද්ධයෙන් දශකයකට පසු ඉහළම මට්ටමට පැමිණ තිබේ. එයින් වැඩි ප්‍රමාණයක් වැයවන්නේ පුනරාවර්තන වියදම් වෙනුවෙනි. එහෙත්, බලකායන් නවීකරණය සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කර නොමැත. ආරක්ෂක වියදම් අඩුකිරීමට හා නැවත හැඩගැස්වීමට කටයුතු කරන ලෙස දැඩිව නිර්දේශ කරනු ලැබේ.

ආරක්ෂක හමුදා සහ රාජ්‍ය ව්‍යවසායයන්ගේ සැබෑ පිරිස්බල අවශ්‍යතාව ගණනය කළ යුතුය. අතිරේක පිරිස් රැකියා සඳහා නැවත යොමුකිරීමක් අවශ්‍යය. රාජ්‍ය සේවයේ සිටින සේවක පිරිස්වල ධාරිතාවන් ගොඩනැගීම සඳහා රජය ඉහළ ආයෝජන සිදුකළ යුතුය. එය නායකත්ව මට්ටමෙන් ආරම්භ කළ යුතුය.

ඵලදායී කාර්යසාධනය තහවුරු කිරීම සඳහා ඔවුන් විසින් අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය. පරිගණක වැනි ස්පර්ශ කළ හැකි දේ පමණක් නොව, විධිමත් කාර්යසාධන සමාලෝචන, අංශවලට ගැලපෙන පරිදි සම්පාදනය කරන ලද පුහුණු සැලසුම් සහ අවශ්‍ය පුහුණු සම්පත් ආදිය සැපයීම ද එයට ඇතුළත් විය යුතුය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පිළිබඳ දිගුකාලීන නිරීක්ෂකයකු වන මහාචාර්ය මික් මුවර් විසින් ලේඛනගත කර තිබෙන පරිදි රාජ්‍ය සේවකයන්ගේ ඵලදායීතාව වැඩිකිරීම සඳහා කරනු ලබන වියදම් අඩුවෙමින් තිබියදී බඳවාගනු ලබන සේවකයන් සංඛ්‍යාව වැඩිවෙමින් තිබිණි.

අඩු වශයෙන්, දැනටමත් නිවේදනය කර තිබෙන පරිදි, ඉහළ පෙලේ රාජ්‍ය ව්‍යවසායක් වන ශ්‍රීලන්කන් ගුවන් සේවය පෞද්ගලීකරණය කිරීම හෝ මගින් ණය හිමියන්ට සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අභිලාෂයන් තිබෙන වෙනත් කණ්ඩායම්වලට බැරෑරුම් පණිවුඩයක් සන්නිවේදනය වනු ඇත. සියලු රාජ්‍ය සංස්ථා සහ රජයට අයත් සමාගම් සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකිරීමට හා පෞද්ගලීකරණය කළ යුතු, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයන් බවට පරිවර්තනය කළ යුතු සහ කළමනාකරණ ප්‍රතිසංස්කරණවලට යටත් කළ යුතු ආයතන හඳුනාගැනීමට කාර්යසාධන බලකායක් පත්කළ යුතුය. රාජ්‍ය ව්‍යවසායන් ඒකාධිකාරී සැපයුම්කාර තත්වයක තිබෙන වෙළඳපොළ නිදහස් කළ යුතුය.

සියලු රාජ්‍ය ව්‍යවසාය දේපළ හා වගකීම් හිමිකාරීත්වය සහිත සමාගම් බවට පත්කර ගිනුම් ප්‍රමිතිවලට අනුගතභාවය වැඩිදියුණු කරගන්නා ලෙස යෝජනා කරනු ලැබේ. ඒවායේ කොටස් යෝග්‍ය කොන්දේසි යටතේ කොළඹ කොටස් වෙළඳපොළෙහි අලෙවි කළ හැකිය. 'යෝග්‍යතාව හා නිසිභාවය පිළිබඳ පරීක්ෂාව'

(fit and proper test) වැනි බැංකු අධ්‍යක්ෂ මණ්ඩලවල භාවිතා කරනු ලබන පටිපාටි මෙම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල වෙනුවෙන් ද යොදාගන්නා ලෙස යෝජනා කරනු ලැබේ. එසේ කරනු ලබන්නේ රාජ්‍ය ව්‍යවසායන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලවලට පත්කරනු ලබන පුද්ගලයන් හට එම කාර්යයන් ඉටුකළ හැකිද යන්න තහවුරු කිරීම සඳහාය.

වාණිජ කටයුතුවල නියුතු රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධයෙන් දැඩි අයවැය සීමා පැණවිය යුතුය. රාජ්‍ය ව්‍යවසායන්ට ණය ලබාදීමේදී රාජ්‍ය බැංක විසින් සාමාන්‍ය අවදානම් ඇගයීම් නිර්ණායක අනුගමනය කළ යුතු බවට උපදෙස් ලබාදිය යුතුය.

| **මැදිහත්වීම** | **කාල සීමාව** |
|---|---|
| රාජ්‍ය අංශයේ බඳවාගැනීම් අත්හිටුවන්න. රජයේ සේවයේ, ආරක්ෂක හමුදාවල සහ රාජ්‍ය ව්‍යවසායන්ගේ සේවක පිරිස් අවශ්‍යතාවන් ගණනය කරන්න. පහළ මට්ටමේ බඳවාගැනීම්වලදී දැනටමත් රජයේ සේවයේ සිටින අය බඳවාගන්න. ආරක්ෂක වියදම් නැවත නිරීක්ෂණය කර, නැවත තක්සේරු කරන්න. | කෙටිකාලීන |
| රාජ්‍ය ව්‍යවසාය වෙනුවෙන් දැඩි අයවැය සීමාවන් පණවන්න. සියලු ප්‍රාග්ධන සහ ජංගම මූල්‍ය ලබාදීම් අත්හිටුවන්න. | කෙටිකාලීන |
| ඉතිරි කරගත් රාජ්‍ය සේවකයන් වෙනුවෙන් පුහුණු කිරීමේ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න. මෙය විශේෂයෙන් ඉහළ මට්ටම් සඳහා අවශ්‍යය. | මධ්‍යකාලීන |
| රාජ්‍ය සේවය වෙනුවෙන් ප්‍රමුඛ කාර්යසාධන දර්ශක (KPIs) නිර්මාණය කරන්න. | මධ්‍යකාලීන |
| ඉහළ ප්‍රතිරූපයක් සහිත රාජ්‍ය ව්‍යවසායයක් පෞද්ගලීකරණය කරන්න (උදා: ශ්‍රීලන්කන් ගුවන් සේවය). අදාළ තැන්වල රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් ස්ථාපිත කරන්න. රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කරන්න. | මධ්‍යකාලීන |
| අදාළ තැන්වලදී රාජ්‍ය ව්‍යවසායන් ක්‍රියාත්මක වන වෙළඳපොළවල් ලිහිල්කරණයට ලක් කරන්න. | මධ්‍යකාලීන |
| රාජ්‍ය ව්‍යවසායන්ට රාජ්‍ය බැංකුවලින් ණය ලබාදීමේදී අවදානම තක්සේරු කර තීරණ ගන්න. | මධ්‍යකාලීන |
| සංස්ථා/ මණ්ඩල/ දෙපාර්තමේන්තුවල සිට සමාගම් දක්වා දේපළ හා වගවීම් හිමි ආයතන බවට පත්කර ඒ සම්බන්ධ දත්තවල ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්න. බඳවාගැනීම් සඳහා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කරන්න ('යෝග්‍යතාව හා නිසිභාවය පිළිබඳ පරීක්ෂාව' (fit and proper test) වැනි) | දිගුකාලීන |
| ප්‍රධාන ආයතන වෙනුවෙන් වෘත්තික මට්ටමේ පාලනයක් සහ නියාමනයක් හඳුන්වාදෙන්න.දගිටම රජයේ තබාගැනීමට සිදුවන ආයතන සම්බන්ධයෙන් කළමනාකරණ විගණනයන් ක්‍රියාත්මක කරන්න. ඒවා මුළුමනින්ම ප්‍රතිව්‍යුහගත කළ යුතුය. නැතිනම් වෙනත් විකල්ප අවශ්‍යය. | දිගුකාලීන |

## 5. සමාජ ආරක්ෂණ ජාලය

සුබසාධන ප්‍රතිලාභ මණ්ඩ පනත 2002දී නීතියක් බවට පත්වුවත්, එය තවමත් ක්‍රියාත්මක කිරීමට නියමිතය. එය යටතේ මණ්ඩලය ක්‍රියාත්මක කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ. එහි දත්ත ගොනුව සම්පූර්ණ කළ යුතුය. සමාජ ආරක්ෂණ ජාලය වහා ක්‍රියාත්මක කළ යුතුය. වර්තමාන තත්වය ආපදාවකට සමාන වන නිසාත්, රජයෙන් ස්ථාවර ප්‍රතිලාභ ලැබෙන පවුල්වලින් 77%කට බැංකු ගිනුම් තිබෙන නිසාත්, මුදල් ප්‍රදාන බැංකු ගිනුම් හෝ ජංගම දුරකථන මගින් මුදල් ලබාගත හැකි ගිනුම් වෙතත් ලබාදෙන ලෙස නිර්දේශ කරනු ලැබේ. කාලයත් සමග ප්‍රතිලාභීන් නිවැරදිව ඉලක්ක කිරීම වැඩිදියුණු කළ හැකිය.

| මැදිහත්වීම | කාල සීමාව |
|---|---|
| ජනගහනයේ අවදානමට ලක්වූ කොටස් වෙත මූල්‍ය ප්‍රදානයන් ලබාදෙන්න. ඍජුව බැංකුවලට හෝ ජංගම දුරකථන ගිනුම්වලට මුදල් ලබාදෙන්න. | කෙටිකාලීන |
| සමාජ ආරක්ෂණ ජාලයේ ඉලක්ක කිරීම වැඩිදියුණු කරන්න. | මධ්‍යම කාලීන |
| සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ සුබසාධන යෝජනාක්‍රම ඒකාබද්ධ ප්‍රතිලාභ දත්ත ගොනුවක් යටතට පත්කරන්න. | මධ්‍යම කාලීන |

## 6. බලශක්තිය සහ මහජන උපයෝගිතා

රටේ වෙළඳ භාණ්ඩ ආනයනයෙන් 15%ක්ම පිරිපහදු නොකරන ලද හා පිරිපහදු කරන ලද පෙට්‍රෝලියම් ඉන්ධන වේ (2022 වන විට මෙම ප්‍රතිශතය තවත් ඉහළ යා හැකිය). ආනයනික ඉන්ධන මිල සූත්‍රයකට අනුව ගණනය කිරීම බොහෝ ලේඛනවල නිර්දේශ කර තිබේ. දැන් එය ක්‍රියාත්මක කර තිබේ. එහෙත්, සත්‍ය මිල සූත්‍රය සහ එහි කාලරාමුව විනිවිද පෙනෙන තත්වයක නැත. එම ගැටලු සම්බන්ධයෙන් පියවර ගත යුතු බව නිර්දේශ කරනු ලැබේ.

විදුලිය නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රධාන යෙදවුමක් වන්නේ ඉන්ධනයි. ජල සම්පාදනයේදී විදුලිය අවශ්‍ය හෙයින් ඉන්ධන නළ ජල සම්පාදනයේදී ද වැදගත් යෙදවුමකි. එම නිසා මෙම උපයෝගිතා සේවා වෙනුවෙන් ද මිල සූත්‍ර හඳුන්වා දිය යුතුය. එල්පී ගෑස් බෙදාහරින්නන් විසින් සිල්ලර මිල සකස් කරනු ලබන්නේ ආනයන මිල හා රුපියලේ වටිනාකම අනුව බව පෙනේ. එබැවින් එල්පී ගෑස් ඇතුළු පෙට්‍රෝලියම් නිෂ්පාදන එම අංශය සම්බන්ධ සුවිශේෂී නීතියක් යටතේ උපයෝගිතා නියාමනය යටතට පත්කළ යුතු බව නිර්දේශ කරනු ලැබේ. මිල හා තත්ව නියාමනය මහජන උපයෝගිතා කොමිෂන් සභාවට පැවරිය යුතුය.

රටට ආනයනය කරනු ලබන ඉන්ධනවලින් 60%ක් වැයවන්නේ ප්‍රවාහනය වෙනුවෙනි. එම හේතුව නිසා, වැඩිපුර මගීන් වඩා ඵලදායී ප්‍රවාහන මාධ්‍ය වෙත යොමුකිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගතහොත්, ලෝක වෙළඳපොළෙහි තිබෙන අවිනිශ්චිත තත්වයන් හේතුවෙන් ජංගම ගිනුමේ හිඟය අඩු කළ නොහැකිය. ඒ සඳහා පොදු ප්‍රවාහනයට ප්‍රමුඛතාව ලබාදෙන ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට සිදුවේ. පෞද්ගලික ප්‍රවාහනය වෙනුවෙන් ලබාදෙන විවිධාකාරයේ සහනාධාර ඉවත්කළ යුතුය. මෙම පරිවර්තනය සඳහා අවශ්‍ය ආයෝජන බාහිර මූලාශ්‍රවලින් ලබාගත යුතුය.

ජනක පද්ධතිවල බර අඩුකිරීම සඳහා විදුලිය විසන්ධි කිරීම ආර්ථිකය සම්බන්ධයෙන් ඍණාත්මක බලපෑම් ඇතිකරයි. කර්මාන්ත සහ පාරිභෝගිකයන් හට ස්ථාවර විදුලි සැපයුමක් ස්ථාපිත කිරීම සඳහා රටෙහි බහුලව ඇති සූර්ය හා සුළං බලයෙන් නිෂ්පාදනය කරනු ලබන විදුලිය ප්‍රමාණය වැඩිකළ යුතුය. මෙම අස්ථාවර මූලාශ්‍රවලින් විදුලි බලය ලබාගැනීමට සහ රට පුරා වරින් වර විදුලිය බිඳවැටීම් සිදුවීම වැළැක්වීම සඳහා විදුලි සම්ප්‍රේෂණ ජාලය යාවත්කාලීන කිරීම පිණිස අමතර ආයෝජන අවශ්‍යය. සම්ප්‍රේෂණ ජාලය වර්තමානයේදී

ක්‍රියාත්මක වන්නේ වෙනම බලපත්‍රයක් යටතේය. එහෙත්, එය දේපළ හිමි වෙනම ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන්නේ නැත. එය ස්වාධීනව ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත්කිරීම සහ ඒ සඳහා කාලීනව අවශ්‍ය මිලදීගැනීම් සිදුකිරීමටත්, වීලිං වැනි සේවා හඳුන්වාදීමටත් ආයෝජන අවශ්‍යය.

ශ්‍රීලන්කන් ගුවන් සේවය පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු, ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ වෙත ගුවන් සේවා ආකර්ෂණය කරගත යුතුය. විශේෂයෙන්ම අඩුමිල ගුවන් සේවා අවශ්‍යය. මත්තල ගුවන් තොටුපළ සම්පූර්ණයෙන්ම වෙළඳපොළකරණය කර තිබේ. කොළඹ ගුවන් තොටුපළ ද පස්වන නිදහස් මට්ටම දක්වා හෝ ලිහිල්කරණය සිදුකිරීමට සලකා බැලිය යුතුය. භූමියේ මෙහෙයුම් කටයුතු ගුවන් සේවාව පෞද්ගලීකරණයේදී එය සමග සම්බන්ධ කළ යුතු නොවේ. ගුවන් තොටුපළ කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වෙනම සහ ඉලක්කගත ප්‍රයත්නයක් දැරිය යුතුය. වර්තමානයේදී තරගකාරීත්වයක් නොමැති භූමි මෙහෙයුම් සේවා ගාස්තු සහ ගුවන් තොටුපළ භාවිතා කරන සියලු ගුවන් සේවාවන්ට වෙනසකින් තොරව සපයනු ලබන සේවා සඳහා ගාස්තු අඩුකිරීම ද එයට අයත්ය.

| මැදිහත්වීම | කාල සීමාව |
|---|---|
| බලශක්තිය සහ ජලය වෙනුවෙන් විනිවිද පෙනෙනසුලු අන්දමින්, ස්වයංක්‍රීයව, වෙළඳපොළ පාදක කරගෙන මිලකරණය. | කෙටිකාලීන |
| සියලු පෙට්‍රෝලියම් නිෂ්පාදන නියාමනය යටතට පත්කිරීම. | කෙටිකාලීන |
| පොදු ප්‍රවාහනය වෙනුවෙන් විදේශ සහාය ලබාගනිමින් ආයෝජන කිරීම | මධ්‍යම කාලීන |
| අවශ්‍ය ආයෝජන සිදුකළ හැකි වන පරිදි සහ වීලිං වැනි සේවාවන් හඳුන්වාදිය හැකි වන පරිදි සම්ප්‍රේෂණ ජාලය වෙන්කිරීම | මධ්‍යම කාලීන |
| ගුවන් තොටුපළ අඩුමිල ගුවන් සේවාවන්ට ආකර්ෂණීය වන අන්දමින් භූමියේ මෙහෙයුම් සේවා නවීකරණය කිරීම | මධ්‍යම කාලීන |
| ශ්‍රීලන්කන් ගුවන් සේවය පෞද්ගලීකරණයෙන් පසු කොළඹ ගුවන් තොටුපොල පස්වන නිදහස් මට්ටම දක්වා ලිහිල්කරණය | මධ්‍යම කාලීන |

## 7. වෙළඳාම සහ කර්මාන්ත

ජාතික අපනයන මූලෝපාය යටතේ 2018දී පත්කරන ලද කමිටු හරහා අපනයනකරුවන් මුහුණදෙන දුෂ්කරතා හඳුනාගත යුතුය. අදාළ රජයේ නිලධාරීන් සහභාගී වන මෙම රැස්වීම්වලදී අපනයනවලට තිබෙන බාධක ඉවත්කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. ඉතා වැදගත් යෙදවුම් ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාගැනීමේ හා බැංකු කටයුතු ආශ්‍රිතව තිබෙන දුෂ්කරතා බාධක අතර තිබිය හැකිය. පසුගිය අවුරුදු කීපය තුළ පිහිටුවන ලද බලපත්‍ර රාජ්‍යය වෙනස් කිරීම අපනයනන ප්‍රවර්ධනය සඳහා අත්‍යවශ්‍යය. අපනයන වෙනුවෙන් ආනයනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ යුතුය.

අර්බුදය හා ඒ සමගම මූලික යටිතල පහසුකම් සේවා පවත්වාගෙන යාමට නොහැකි වීම හේතුවෙන් කර්මාන්ත කලාප නැවත සාකච්ඡාවට භාජනය වී තිබේ. 1980 දශකයේදී මෙන් නොව, වර්තමානයේදී පෞද්ගලිකව

කළමනාකරණය කරනු ලබන කර්මාන්ත කලාපවලට අවසර ලබාදිය යුතුව තිබේ. එහිදී ආයෝජන සම්බන්ධයෙන් මෙන්ම කර්මාන්ත ශාලා පවත්වාගෙන යන්නන් බඳවාගැනීම සම්බන්ධයෙන් ද මෙහෙයුම්කරුවන් වගකිව යුතුය.

| මැදිහත්වීම | කාලසීමාව |
|---|---|
| විකෘතීන් ඉවත් කිරීමෙන්, ආනයන පාලකයාගේ භූමිකාව පිළිබඳ නැවත සලකා බැලීමෙන් සහ බලපත්‍ර රාජ්‍යය වෙනස් කිරීමෙන් වෙළඳාමට පහසුකම් සලසන ප්‍රතිසංස්කරණ වේගවත් කළ යුතුය. | කෙටිකාලීන |
| අපනයන වෙනුවෙන් ආනයන කිරීමේ අවශ්‍යතාව අවබෝධ කරගැනීම සඳහා දිරිගැන්වීම | කෙටිකාලීන |
| පෞද්ගලික කර්මාන්ත කලාප වෙනුවෙන් නීති බලාත්මක කිරීම | මධ්‍යම කාලීන |

## 8. යථා තත්වයට පත්වීම සඳහා අත්‍යවශ්‍ය විශේෂිත නීති

ව්‍යවසායයන් විශාල සංඛ්‍යාවක් අසාර්ථක වනු ඇති බව ද, ඇතැම් විට ලක්ෂ ගණන් ජනයාට අර්බුදය නිසා රැකියා අහිමි විය හැකි බව ද අපේක්ෂා කරනු ලැබේ. පෙර නොවූ විරූ මෙම අර්බුදයට මුහුණදීම සඳහා දැනට පවතින නීති ප්‍රමාණවත් නොවේ. සියලු ව්‍යවසායයන්ට අදාළව බංකොලොත්භාවය සම්බන්ධයෙන් අලුත් නීති බලාත්මක නොකළහොත් යථා තත්වයට පත්වීම සඳහා දිගු කලක් ගතවනු ඇත. එසේම, රැකියා අහිමි වන සේවකයන් වෙනුවෙන් 'සේවකයන්ගේ රැකියා අහිමි කිරීමේ පනතට' වඩා යථාර්ථවාදී යාන්ත්‍රණයක් නිර්මාණය නොකළහොත්, ව්‍යවසායයන්ට ආරක්ෂා වීමට නොහැකි වනු ඇත.

| මැදිහත්වීම | කාල සීමාව |
|---|---|
| සියලු ව්‍යවසායන්ට අදාළ වන බංකොලොත්භාවය පිළිබඳ ඒකාබද්ධ නීති ඉක්මනින් ක්‍රියාත්මක කරන්න. | කෙටිකාලීන |
| සේවකයන්ගේ රැකියා අහිමි කිරීමේ පනත වෙනුවට විරැකියා රක්ෂණ අරමුදලක් පිහිටුවන්න. | කෙටිකාලීන |

වැඩිදුර විස්තර සඳහා විමසන්න: රොහාන් සමරජීව +94 77 735 2361

## 1 ඇමුණුම: ප්‍රතිපත්ති යෝජනා සන්සන්දනය

පුළුල් පරාසයක දෘෂ්ටිවාදී දැක්ම නියෝජනය කරන ප්‍රතිපත්ති යෝජනා අටක් මෙම ලේඛනය සම්පාදනය කිරීම සඳහා පදනම් කරගන්නා ලදී. එම යෝජනා අතර පහත දැක්වෙන ඒවා වේ:

| කර්තෘ | යෝජනාවලියේ නම |
|---|---|
| ඇඩ්වොකාටා ආයතනය | ආර්ථිකය නැවත පණගැන්වීම සඳහා සත්වැදෑරුම් ප්‍රතිපත්ති නිර්දේශ |
| ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) | දේශපාලන හා ආර්ථික ස්ථාවරභාවය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ යෝජනා |
| ඇල්ලේ ගුණවංශ හිමි (EGT) | පුනර්ජීවනයේ මහජන සම්මුතිය |
| ස්වාධීන ආර්ථික විද්‍යාඥයෝ (IE) | හදිසි ආර්ථික ස්ථායීකරණ සැලැස්ම |
| සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරය (NMSJ) | ශ්‍රී ලංකාවේ වර්තමාන අර්බුදයට ප්‍රතිචාර සඳහා පොදු අවම වැඩසටහනක් |
| ජාතික ජනතා බලවේගය (NPP) | වර්තමාන අභියෝග පරාජය කිරීම සඳහා වේගවත් ප්‍රතිචාර |
| සමගි ජන බලවේගය (SJB) | ශ්‍රී ලංකාවේ ආර්ථිකය පණගැන්වීම සඳහා ජාතික සමගි බලවේගයේ නවවැදෑරුම් ක්‍රියාකාරී සැලැස්ම |
| 43 සේනාංකය | අපි බලාපොරොත්තු සහගත වෙමු: ගොඩඑමු; ගොඩනගමු |

මෙම යෝජනා විසින් පුළුල් තේමාත්මක කලාප 15ක් ආවරණය කරන ලදී. වඩාත්ම ආර්ථික වශයෙන් අදාළ වන කලාප අටක් කෙරෙහි අපි අවධානය යොමුකළෙමු (එහි ප්‍රතිපලයක් ලෙස, ආර්ථික විද්‍යාඥයන් සහ ව්‍යාපාරික නායකයන් සමග සිදුකරන ලද පහත දැක්වෙන උපදෙස් විමසීම සංස්කරණය කළෙමු. බලන්න ඇමුණුම 2 හා 3)

| | | | | |
|---|---|---|---|---|
| ආර්ථික | ණය කළමනාකරණය | මූල්‍ය සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති | ආදායම් ස්ථාවර කරගැනීම | වියදම් පාලනය |
| | සමාජ ආරක්ෂණ ජාල | වෙළඳාම | කර්මාන්ත | බලශක්තිය සහ උපයෝගිතා |
| රාජ්‍ය පාලනය | ව්‍යවස්ථාමය හා පරිපාලන ප්‍රතිසංස්කරණ | යහපාලනය | | |
| වෙනත් | විදේශ සම්බන්ධතා | අධ්‍යාපනය | සෞඛ්‍යාරක්ෂාව | |
| | භෞතික ආරක්ෂාව හා ජීවිත ආරක්ෂාව | විවිධත්වය සහ ඇතුළත්කරගැනීම | | |

මෙම බොහෝ ක්ෂේත්‍රවල ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව සම්බන්ධයෙන් පුළුල් එකඟතාවක් නිර්මාණය විය[1].

| *තේමාව* | *ඇඩ්වොකාටා* | *BASL* | *EGT* | *IE* | *NMSJ* | *NPP* | *SJB* | *43 සේනාංකය* |
|---|---|---|---|---|---|---|---|---|
| වියදම් පාලනය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| සමාජ ආරක්ෂණ ජාලය | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| ණය කළමනාකරණය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| මූල්‍ය සහ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | ✓ |

[1] මෙහි ලැයිස්තුගත කර ඇති සමහර ප්‍රතිපත්ති යෝජනා කතුවරුන්ගේ දැක්ම පිළිබඳ පරිපූර්ණ චිත්‍රයක් ඉදිරිපත් නොකළ හැකිය. වෙනස්කම්වලට හේතුව වන්නේ යෝජනා නිකුත් කරන වේලාවේ තත්වයන්, යෝජනාවලදී සලකා බලන ලද කාලසීමාවන් සහ මතවාදය සහ ප්‍රවීණත්වය වැනි සාධක මගින් නිර්මාණය කරනු ලබන විශේෂිත මැදිහත්වීම්ය.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ස්ථාවර කරගැනීම | ✓ | | | ✓ | ✓ | | ✓ | ✓ |
| වෙළඳාම | ✓ | | ✓ | | ✓ | ✓ | | ✓ |
| කර්මාන්ත | ✓ | ✓ | ✓ | | | ✓ | | ✓ |
| බලශක්තිය සහ මහජන උපයෝගිතා | | | | ✓ | ✓ | | | ✓ |

## 2 ඇමුණුම: උපදෙස් විමසීම්වලට සහභාගි වූ ආර්ථික විද්‍යාඥයෝ

ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයන්

- ආචාර්ය සරත් රාජපතිරණ
- මහාචාර්ය සිරිමල් අබේරත්න
- මුර්ටාසා ජැෆර්ජී

තරුණ ආර්ථික විද්‍යාඥයන්

- රෙහානා තව්ෆීක්
- ෂායු දම්සිංහ
- උමේෂ් මොරමුදලි
- නකියා ෂිරාස්
- කේ.ඩී. විමංග
- අනුෂ්ක විජේසිංහ
- ගයනි හුරුල්ලෙ

වෙනත් අය

- කරු ජයසූරිය මහතා
- මහාචාර්ය රොහාන් සමරජීව
- ධනනාත් ප්‍රනාන්දු

## 3 ඇමුණුම: උපදෙස් විමසීමට සහභාගි වූ ව්‍යාපාරික නායකයෝ

- ක්‍රිෂාන් බාලේන්ද්‍ර
- රොහාන් පල්ලෙවත්ත
- සංජීව වීරවරණ
- හනීෆ් යූසුෆ්
- මංගල බෝයගොඩ
- සමන්ත රණතුංග
- දේව රුද්‍රිගු
- ආර්. මනිවන්නන්
- සුජාන් විජේවර්ධන

වෙනත්

- කරු ජයසූරිය මහතා
- මහාචාර්ය රොහාන් සමරජීව
- ගයනි හුරුල්ලේ
- ධනනාත් ප්‍රනාන්දු
- හරීන්ද්‍ර දසනායක